# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2054/29 – 2018 ජනවාරි මස 16 වැනි අඟහරුවාදා – 2018.01.16**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/21/40/2008.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.08.30 දිනැති හා අංක 1773/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2012.08.09 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බත්තරමුල්ල, ශ්‍රී සුභූති පුර, වීර මාවත, අංක 12/2 හි පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 03, ආර්.ඒ.ද මැල් මාවත, අංක 413 හි පිහිටි හොල්සිම් ලංකා ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.06.14 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර
කම්කරු කොමසාරිස් ජනරාල්

2018 ජනවාරි මස 15 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය,


1A – G 26952 – 35 (2018/01)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය : අයිආර්/21/40/2008.

කාර්මික අධිකරණයේ දීය

*එක් පාර්ශ්වයක් වශයෙන්,*
අන්තර් සමාගම් සේවක සංගමය,
අංක 12/2 වීර මාවත,
ශ්‍රී සුභූති පුර,
බත්තරමුල්ල.

නඩු අංකය : ඒ /3468

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

හොල්සිම් ලංකා ලිමිටඩ්,
අංක 413, ආර්.ඒ ද මැල් මාවත,
කොළඹ 03.

අතර පැවති කාර්මික ආරවුල සම්බන්ධ ප්‍රදානයයි.

කම්කරු හා කම්කරු සබඳතා ගරු අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 [1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා] දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව උක්ත දෙපාර්ශ්වය අතර කාර්මික ආරවුලක් පවත්නා හෙයින් එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් වෂී 2012.08.09 වන දින මා පත්කොට ඇත.

පූර්වොක්ත දෙපාර්ශ්වය අතර පැවති කාර්මික ආරවුලට හේතු වී පැවති කරුණ වූයේ ''හොල්සිම් ලංකා ලිමිටඩ් ආයතනයේ නිෂ්පාදන මෙහෙයුම් කටයුතුවල නියැලෙන ෆෝමන් හා සුපර්වයිසර් යන සේවා කාණ්ඩවල සුපරීක්ෂක (14 වන ශ්‍රේණියේ) සේවකයින්ට ලබාදෙන රු.15,000/=ක දීමනාව නිෂ්පාදන මෙහෙයුම් කටයුතුවලට දායකත්වය දැක්වීම යන පදනම මත එම සේවා කාණ්ඩවලට අයත් පහළ ශ්‍රේණිවල සේවකයන්ට ලබා නොදීම සාධාරණ ද නැතහොත් ඔවුන්ට ලබා දිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ''.

බේරුම්කරණ කාර්යය පටිපාටිය ආරම්භ කළ 2012.10.31 දින මුල් අවස්ථාවේදීම දෙපාර්ශ්වයට බලපාන ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ඉල්ලුම්කාර පාර්ශ්වයේ නීතීඥ මහතා සාකච්ඡාවට ගන්නා ලදී. එනම් යොමුවේ සඳහන් රු.15,000/= සම්බන්ධව ආරවුලට අදාලව පැවති සාකච්ඡා සහ යොමුව අතර නොගැලපෙන තත්වයක් පවත්නා හෙයින් එය රු.10,000/= ලෙස වෙනස් කොට මෙම බේරුම්කරණ කටයුක්ත ඉදිරියට ගෙන යාමට ඉල්ලුම්කරුවන් වෙනුවෙන් අවසර අයැද සිටියේය. ඊට වගඋත්තරකාර පාර්ශ්වයේ විරුද්ධත්වයක් නොමැති බව ද අනාවරණය විය.

මෙම කරුණ සම්බන්ධයෙන් ලිඛිත සැලකිරීම් ඉදිරිපත් කරමින් කම්කරු කොමසාරිස්වරයා වෙත 2008.07.18 දින ඉදිරිපත් කරන ලද ලිපියක් A2 ලෙසත් වගඋත්තරකාර පාර්ශ්වයේ මානව සම්පත් උප සභාපති වෙත යවන ලද ලිපියේ සත්‍ය පිටපතක් A3 ලෙස ද, 2009.06.17 දින කම්කරු කොමසාරිස්තුමා වෙත යවන ලද ලිපිය A4 ලෙස ද, 2009.10.01 දින නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයා වෙත යවන ලද ලිපිය A5 ලෙස ද ලකුණු කොට ඉදිරිපත් කරමින් එකී සලකුණු කරන ලද සියලුම ලිපි වලින් සනාථ වනුයේ යථොක්ත මුදල රු.10,000/= බැවින් ගොනුවේ සඳහන් මුදල ද රු.10,000/= විය යුතුය යන්න බේරුම්කරණය, ඉල්ලුම්කරු සහ වගඋත්තරකරු යන තුන් පාර්ශවයම පිළිගන්නා ලදහ.

තව ද විසඳිය යුතු කරුණක් වූයේ 2012.08.03 දිනැති කම්කරු කොමසාරිස්තුමාගේ යොමුවේ වගඋත්තරකාර පාර්ශවය ''හොල්සිම් ලංකා ලිමිටඩ්'' යන්න වෂී 2016 සැප්තැම්බර් 16 දින සිට වෂී 2007 අංක 07 දරන සමාගම් පනතේ 8(3) ආ වගන්තිය ප්‍රකාරව ''සියාම් සිටි සිමෙන්ට් (ලංකා) ලිමිටඩ්'' ලෙස සංස්ථාගතව තිබීම හේතුවෙන් යොමුවේ සඳහන්ව පැවති වගඋත්තරකරු සංශෝධනයට යටත්ව මෙම නව සමාගම වූ ''සියාම් සිටි සිමෙන්ට් (ලංකා) ලිමිටඩ්'' ලෙස සංශෝධනයට යටත්ව ප්‍රදානය ලබා දීමේ දී වෙනස් වූ බව ඉල්ලුම්කාර හා වගඋත්තරකාර යන දෙපාර්ශවයේ නීතීඥ මණ්ඩලය ඒකමතිකව පිළිගත්හ.

ඉල්ලුම්කරුවන් වෙනුවෙන් අන්තර් සමාගම් සේවක සංගමය සඳහා නීතීඥ ජානක අධිකාරි මහතා පෙනී සිටි අතර වගඋත්තරකරු වෙනුවෙන් ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය නියෝජනය කරමින් නීතීඥ ධනංජය ජයකොඩි මහතා ද පෙනී සිටිමින් බේරුම්කරණය වෙත උපකාර කළහ.

අවසානයේ දෙපාර්ශවයම ලිඛිත දේශන ඉදිරිපත් කරමින් තම තමන්ගේ ස්ථාවරයන් පැහැදිලි කර සිටියහ.

දෙපාර්ශවය අතර ආරවුලට අදාළ හේතු හා ප්‍රති ප්‍රකාශ ඉදිරිපත් කළ අතර මුල් අවස්ථාවේදීම හබය පිළිබඳ සමථයක් වෙත්දැයි විමසන ලදුව එසේ නොවන බැව් හෙළි වූයෙන් විභාගය ආරම්භ කරන ලදී.

ඉල්ලුම්කරුවන් වෙනුවෙන් වයි.ඒ.ද සිල්වා මහතා සාක්ෂි ඉදිරිපත් කරමින් තමා සාක්ෂාත් කරනුයේ තම ආයතනයේ ඇතැම් සේවක කොටසක් කෙරෙහි ආයතනය විසින් මසකට රු.10,000/= ක දීමනාවක් 2007 වර්ෂයේදී සිට දීමට ආරම්භවීමත් පිළිබඳවය. එකී දීමනාව පුත්තලම අරුවක්කාරු හා ගාල්ල යන සේවා ස්ථානවල සේවකයින් කෙරෙහි ලබාදුන් බව ප්‍රකාශ කළේය. එකී රු. 10,000/= ක මුදල ආයතනයේ 14වන ශ්‍රේණියේ එනම් වැඩ පරීක්ෂකවරුන් වෙත එම මුදල ලබා දුන් බවත්, අනෙකුත් 10,11,12,13 වන ශ්‍රේණිවල අයට එකී මුදල ලබානොදුන් බවත් හේ සාක්ෂාත් කළේය.

තම සේවා ස්ථානයේ සාමූහික ගිවිසුමක් ක්‍රියාත්මක බවත්, ඊට ආයතනයේ 14 ශ්‍රේණියේ සේවකයින් මෙන්ම වෙනත් ශ්‍රේණිවල සියලුම සේවකයින්ද ඇතුළත් බවත් කියා සිටියේය. කාර්යය සටහන් 34 පිටුව ඒ බව හෙළි කරයි.

යථොක්ත සාමූහික ගිවිසුම මගින් ආයතනයේ සේවකයින්ගේ වැටුප් සම්බන්ධ තීරණ ගන්නා බවත්, වැටුප් වැඩිවීම් සම්බන්ධ තීරණ ද, බෝනස් පිළිබඳ තීරණ ද, පාරිතෝෂික දීමනා ද, විනෝද චාරිකා දීමනා හා අංශ දීමනාත්, මුර දීමනාත් ආදී සියලු කරුණු සාමූහික ගිවිසුම මත එකඟතාවයෙන් ගන්නා ලද පියවර කීපයක් බවත් හෙළි කළේය. X1 ලෙස සලකුණු කරන ලද සාමූහික ගිවිසුම වර්‍ෂ 2012 දී අත්සන් කරන ලද සාමූහික ගිවිසුම වන අතර එය 2012-2014 යන වර්‍ෂ තුන සඳහා බලාත්මක බවත් හෙළි විය. X3 දරන සාමූහික ගිවිසුම අදාළ කාර්මික ආරවුල ඇති වන සමයේ බලාත්මකව පැවති සාමූහික ගිවිසුම බවත් සාක්ෂාත් කළේය.

සාමූහික ගිවිසුමෙන් ආවරණය වූ සේවකයන් වූයේ ආයතනයේ 14 ශ්‍රේණිය හා ඉන් පහළ ශ්‍රේණීන් බව ගිවිසුමේ දෙවන වගන්තියෙන් පැහැදිලිය. ඒ අනුව ආයතනයේ සියලු සේවකයින් සමාන තත්වයකින් සිටි සේවක සමූහයක් බැව් පැහැදිලිය.

එකම සාමූහික ගිවිසුමකින් සියලු සේවකයින් ආවරණය වූයේ නමුදු එක් ශ්‍රේණියකට පමණක් අයත් සේවක කොටසක් සඳහා ඔවුන්ට රු. 10,000/=ක දීමනාවක් ගෙවීම අයුක්ති සහගත බව ද එකී සාක්ෂිකරු අනාවරණය කර ඇත. ඒ අනුව රු.10,000/= ක දීමනාව අන්‍ය වූ සේවකයින් හට ද ලැබිය යුතු බව මෙම සාක්ෂිකරු තර්ක කර ඇත.

තවදුරටත් සාක්ෂි දුන් සාක්ෂිකරු තම ආයතනයේ සේවකයින් හා කළමනාකාරිත්වය අතර සාමූහික ගිවිසුමක් නොපවත්නා බවත්, සාමූහික ගිවිසුමෙන් ආවරණය වන සේවකයින් නම් 14 වන ශ්‍රේණියෙන් පහළට සියලුම ශ්‍රේණිවලට අයත් සේවකයින් බවත් සාක්ෂාත් කරන ලදී.

තව ද, අදාළ සාමූහික ගිවිසුමේ 4 වන වගන්තිය අනුව ''ආවරණය වූ හා බන්ධනය වූ පුද්ගලයින්'' යන වගන්තිය ප්‍රකාරව මෙසේ දැක්වේ.

''මෙම ගිවිසුමෙන් සමාගම හා වෘත්තීය සමිතිය හා සමාගම විසින් සේවයේ යොදවා ඇති සමාගම් ප්‍රතිපත්ති අත්පොතෙහි නිර්වචනය කරන ලද ''හේ'' මට්ටම් 14 සහ 14න් පහළ මට්ටම්වල වෘත්තීය සමිතියේ සාමාජිකයින් ආවරණය වේ. මේ අනුව මධ්‍යම කළමනාකරණ මට්ටම්වල අයවලුන් ඉන් ඉහළ කළමනාකරණ මට්ටම්වල අය මින් ආවරණය නොවේ. කෙසේ වුවද කළමනාකරණ මට්ටමේ වෘත්තීය සමිති සාමාජිකයින් සඳහා වෘත්තීය සමිතියට මැදිහත්වීමට ඇති අයිතියට සමාගම විරුද්ධ නොවේ.''

එම වාක්‍යාංශයේ අර්ථය ඉංග්‍රීසි පිටපතෙහි මෙසේ දැක්වේ.

(2) Parties covered and bound:

"This agreement shall cover and bind the Employer and the Trade Union and its members who are permanent employees of Hay 14 and below levels (FML and NML Level) in the company policy manned accordingly the employees in middle management level and senior management levels are not covered"

මේ අනුව පළමු සාක්ෂිකරුට අනුව හා සාමූහික ගිවිසුම අනුව එහි අර්ථලාභීන් වන ෆෝමන් සුපවයිසර් වැනි සේවා කාණ්ඩවල සුපරීක්ෂක 14 වන ශ්‍රේණියේ සේවකයින් හා නිෂ්පාදන මෙහෙයුම් කටයුතුවලට දායකත්වය දක්වනු ලබන සේවා කාණ්ඩවලට අයත් කළමනාකරු නොවන ශ්‍රේණිවල සේවකයින් ද අදාළ සාමූහික ගිවිසුමේ එක හා සමාන අර්ථලාභීන් බැව් පැහැදිලි වේ.

තවදුරටත් බලත්, අදාළ සාමූහික ගිවිසුම මගින් යථෝක්ත ගිවිසුමෙන් ආවරණය වන පාර්ශවයන්ගේ වැටුප් වැඩිකිරීම, විචල්‍ය දීමනා මූලික වැටුපට අන්තර්ග්‍රහණය කිරීම, වාර්ෂික ප්‍රසාද දීමනා විශ්‍රාම පාරිතෝෂිත දීමනාව ගණනය කිරීම නිවාඩු දින දර්ශනය, මුර දීමනා හා රුහුණු සිමෙන්ති කම්හලේ වැටුප පුත්තලම සිමෙන්ති කම්හලේ වැටුප් සමග ගැලපීම, අධිකරණ බලය ඇති සියලු අංශයන් කෙරෙහි බලපැවැත්ම පිළිබඳව පාර්ශවයන් එකඟතාවය මත ගිවිසගෙන ඇත.

මෙම පළමු සාක්ෂිකරු තවදුරටත් සිය සාක්ෂිය දෙමින්,

ප්‍ර: එකම සාමූහික ගිවිසුමක තීරණය එක් සේවක පිරිසක් අතරින් එක් ශ්‍රේණියකට විතරක් තමයි නේද රු, 10,000/- ලැබුනේ?

උ: ඔව්

ප්‍ර: ඒ අනුව ඔබ හිතන්නේ රු. 10,000/- දෙන එක අනෙක් සේවකයන් හටත් ලැබිය යුතුය කියාද?

උ: ඔව්

(කාර්යය සටහන් පිටුව 40)

මූලික සාක්ෂි විභාගය හරස් ප්‍රශ්න හා නැවත ප්‍රශ්න ආදී අවස්ථාවන්ට ඉල්ලුම්කරුවන්ගේ සාක්ෂිකරුවන් මුහුණදීමෙන් සාක්ෂි අවසන් කරන ලදී.

ඉල්ලුම්කරුවන් වෙනුවෙන් සාක්ෂි දුන් සී. එල්. මෙන්ඩිස් මහතා තමා ගාල්ල සිමෙන්ති නිෂ්පාදනාගාරයේ සේවය කරන බවත්, අවුරුදු 13 ක සේවා කාලයක් සපුරා ඇති බවත් සාක්ෂාත් කළේය.

ඔහු විසින් සිය සාක්ෂියේ දී A 01 දරන ලේඛනය ඉදිරිපත් කරමින් ''ආයතනයේ වැඩබිම්වල සේවය කරන මෙහෙයුම් කටයුතුවලට සම්බන්ධ 14 ශ්‍රේණියේ නිලධාරීන්ට දූනට ලැබෙන වෙනත් දීමනා වෙනුවට තමයි මෙම රු. 10,000/- දීමනාව ලබා දෙන්නේ කියලා''

උ: ඔව්

(105 පිටුව කාර්යය සටහන්)

ගාල්ල ආයතනයේ 14 ශ්‍රේණියේ නිලධාරීන් නොමැති අවස්ථාවන්හි දී 11 වන ශ්‍රේණියේ අය වැඩ ආවරණය කරන බවත්, සම්පූර්ණ වගකීම් භාරව කටයුතු කරන බවත් 14 වන ශ්‍රේණියේ අය නොමැති වුව ද කිසිම ආකාරයක සේවා ඇණහිටීමක් නොමැතිව වගඋත්තරකරුගේ නිෂ්පාදන ක්‍රියාවලියට අත හිත දී ක්‍රියාකරන බවත් එබැවින් රු. 10,000/- ක දීමනාව පහළ ශ්‍රේණිවල අයටත් ලැබිය යුතු බව ද, සියලුම ශ්‍රේණිවල සේවකයන් එක හා සමානව නිෂ්පාදන ක්‍රියාවලියේ දී බාර ගන්නා බවත්, එහෙත් 14 ශ්‍රේණියේ අයට පමණක් රු. 10,000/- ක දීමනාව ලැබෙන බවත් සාක්ෂාත් කළේය. (කාර්යය සටහන් 103 හා 104 පිටු)

වගඋත්තරකරු වෙනුවෙන් එල්. සී. ටී. එස්. බාලසූරිය නමැති වගඋත්තරකරුගේ මානව සම්පත් නිලධාරී තැන සාක්ෂි දෙමින් වගඋත්තරකාර ආයතනයේ (අ) ඉහළ කළමනාකාරිත්ව ස්ථරය (ආ) මධ්‍ය කළමනාකාරිත්ව ස්ථරය (ඇ) ඉදිරි කළමනාකාරිත්ව ස්ථරය (ඈ) කළමනාකාරිත්වයේ නොවන සේවක ස්ථරය වශයෙන් කොටස් හතරකට බෙදිය හැකි බවත් NML සේවකයන්, FML සේවකයන් භුක්තිවිඳින වරප්‍රසාද ඉල්ලාසිටින බවත් කීය. තව ද R 01 වශයෙන් සලකුණු කරන ලද ලේඛනය සාක්ෂිකරු විසින්ම සකස්කරගත් NML, FML කැටගරිවල පුද්ගලයන්ගේ වැටුප් හා වගකීම්, වරප්‍රසාද, සුදුසුකම් පිළිබඳ විස්තරයක් බවත් සාක්ෂාත් කළ අතර එය මෙම බේරුම්කරණ විභාගය සඳහාම සාක්ෂිකරු විසින් සකස්කරන ලද ලේඛනයක් බවත් පිළිගත හැකි ප්‍රසිද්ධ ලේඛනයක් නොවන බවත් පිළිගෙන සාක්ෂි දුන් බැවින් එය පිළිගැනීම ප්‍රතික්ෂේප කරන ලදී. (විස්තරය කාර්යය සටහන් 156 හා 157 පිටුවල දූක්වේ.)

වගඋත්තරකරුගේ මානව සම්පත් නිලධාරී බාලසූරිය මහතා හරස් ප්‍රශ්න සඳහා පිළිතුරු දෙමින් (කාර්යය සටහන් 169 පිටුව)

''ප්‍ර : 14 වන ශ්‍රේණියක් කියලා තිබෙනවා ද?

උ : ඔව්

ප්‍ර : 14 ශ්‍රේණිය සාමූහික ගිවිසුමෙන් ආවරණය වෙනවා ද?

උ : 14 ශ්‍රේණිය සාමූහික ගිවිසුමෙන් ආවරණය වෙනවා.

ප්‍ර : සාමූහික ගිවිසුම අත්සන් කරල තිබෙන්නේ සංගමය නේද ?

උ : ඔව්''

(කාර්යය සටහන් පිටුව 170 අනුව මෙසේ දූක්වේ)

එනම්,

''ප්‍ර : R ලේඛනය අනුව 14 ශ්‍රේණිය හා ඉන් පහළ කට්ටිය මේ සාමූහික ගිවිසුම අතරින් ආවරණය වෙනවා කියලා තිබෙනවා ද?

උ : ඔව්

(කාර්යය සටහන් 171 පිටුවේ මෙසේ දැක්වේ)

ප්‍ර : සාක්ෂිකරු 14 ශ්‍රේණිය හා එතැනින් පහළ අය මේ සාමූහික ගිවිසුමෙන් ආවරණය වෙනවාය කියලා මේ ගිවිසුමේ පැහැදිලිව තියෙනවා ද?

උ : තියෙනවා

ප්‍ර : ඒ ගිවිසුමට හොල්සිම් ලංකා සමාගම අත්සන් කරල තියෙනවා ද?

උ : ඔව්

ප්‍ර : වෘත්තීය සමිතිය අත්සන් කරල තියෙනවා ද?

උ : ඔව්''

179 පිටුවේ මෙසේ ද දැක්වේ.

''ප්‍ර : සාක්ෂිකරු මේ රු. 10,000/- දීමනාව ගාල්ලේ ඉන්න මේ ශ්‍රේණියේ අයටත් ලබාදුන්නා ?

උ : ගාල්ලේ අයටත් ලබා දුන්නා.

ප්‍ර : සාක්ෂිකරු ඔබ සාක්ෂි දෙමින් කිව්වා ඒ රු. 10,000/- ලබා දෙන්න හේතුව තමයි ඉන්ධන සඳහා ලබාදුන්න දීමනාව කපා හැරීම හා යතුරුපැදි ආපසු ආයතනය වෙත ලබා ගැනීම කියලා ?

උ : හරි

ප්‍ර : ඔබ දන්නවද සාක්ෂිකරු ගාල්ලේ FML 14 ශ්‍රේණියේ කිසිම කෙනෙකුට 2007 වර්ෂයේ දී යතුරුපැදි දීලා තිබුණෙ නැහැ. ඉන්ධන දීමනාව ඔවුන්ට ලැබුණෙත් නැහැ කියලා.

උ : දන්නවා.''

2007 වර්ෂයේ දී ගාල්ලේ කිසිදු සේවකයෙකුට ඉන්ධන දීමනාව ලබා නොදුන් බවත්, යතුරුපැදි ලබා දී නොතිබූ බවත් සාක්ෂිකරු පිළිගනී. තව ද සාමූහික ගිවිසුම අදාළ වන සේවකයින් සෑම අතින්ම එකම තලයකට වැටෙන හෙයින් ඔවුන් එකම සාමූහික ගිවිසුමකින් ආවරණය කරන බැව් සාක්ෂිකරු පිළිගනී. (පිටුව 181)

218 පිටුව,

''ප්‍ර : සාමූහික ගිවිසුම ආවරණය වුණු ශ්‍රේණියකට විශේෂයෙන් එහෙම දීමනාවක් දුන්න කාරණය සාධාරණ නැහැ අනික් අයට නොදී කියලා මම ඔබට යෝජනා කරනවා.

උ : උත්තරයක් නැත.

වගඋත්තරකරුගේ සාක්ෂිකාර හා මානව සම්පත් කළමනාකාර බාලසූරිය මහතාගේ සාක්ෂියේ දී ඉහත කරුණ පිළිගනී. ඒ මහතා වග උත්තරකාර පක්ෂයේ නීතිඥ මහතාගේ නැවත ප්‍රශ්න සඳහා පිළිතුරු දෙමින් (2015.10.29 දින කාර්යය සටහන් පිටුව 237) ආයතනයේ මානව සම්පත් නිලධාරි තැන මෙසේ ප්‍රකාශ කර සිටී.

ප්‍ර : FML බහුතරයක් කවුද ?

උ : බහුතර සාමාජිකයින් මේ වන විට තාක්ෂණ නිලධාරින්.

ප්‍ර : ඒ වන විට තිබ්බ ද?

උ: අන්තර් සමාගම් සේවක සංගමයේ තාක්ෂණ නිලධාරි තිබ්බද නැද්ද කියන්න මතක නැහැ.

ප්‍ර: අන්තර් සමාගම් සේවක සංගමයේ බහුතර විශ්වාසයක්.

උ: ඔව්.

ප්‍ර: 14 ශ්‍රේණියට වැටුප් වැඩිවීමක් ලබා දුන්නද?

උ: සාමූහික ගිවිසුමෙන් ලබාදුන්නා.

ප්‍ර: වැටුප් වැඩිවීම් ලබාදුන්නේ ඔවුන් පාර්ශ්වකරුවන් ලෙස ද නැතිනම් ඔවුන්ට වෙනම වැඩිවිය යුතු නිසාද?

උ: 2007 සාමූහික ගිවිසුමේ වගන්තියේ තිබ්බ 14 ශ්‍රේණියේ අන්තර් සමාගම් සේවක සංගමයේ සාමාජිකයින් අදාළ වේ කියලා……… වැටුප් වැඩිඋනේ ප්‍රතිශතයකින්''

යනුවෙන් ප්‍රකාශකර සිටී. පිටුව 237.

වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ තත්ත්ව පාලක ජේ. එම්. ඩබ්ලිව්. ජයසුන්දර මහතා සාක්ෂි දෙමින් 2016, 2017, 2018 සාමූහික ගිවිසුම x 6 ලෙස සලකුණු කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වය ඊට විරෝධය පළකරමින් විසඳිය යුතු ප්‍රශ්නය 2012.08.03 වැනි දින වන විට ඉදිරිපත්ව තිබූ හෙයින් ඊට අවුරුදු 04 කට පසු 2016, 2017, 2018 වර්ෂවලට අත්සන් කරනු ලැබූ සාමූහික ගිවිසුම තම සාක්ෂිකරු මගින් සලකුණු කිරීමට ඉඩ නොදිය හැකි බැව් ප්‍රකාශ කළේය. එහෙත් 2016, 2017, 2018 දරන සාමූහික ගිවිසුම x 6 වශයෙන් සලකුණු කොට 2016.07.28 දින බේරුම්කරණය වෙත ඉදිරිපත් කොට තිබීම වගඋත්තරකරුට අමතකව පැවතියා විය හැක.

එම සාක්ෂිකරු තමාට රු. 10,000/- දීමනාව ද, අතිකාල දීමනා ද, ප්‍රසාද දීමනා ද, බෝනස් මුදල ද සාමූහික ගිවිසුම අත්සන් කළාට පසු වැඩිවන බෝනස් මුදල් ද, අත්සන් කරන ලද සියලු සාමූහික ගිවිසුම් අනුව ලැබෙන බවත් සාක්ෂාත් කළේය.

සාක්ෂි විශ්ලේෂණයේ දී ලේඛන පිරික්සීමේදී පහත කරුණු හෙළි වේ:

(i) සාමූහික ගිවිසුම මගින් වැදගත් තීන්දු තීරණ සේවක සේව්‍ය දෙපක්ෂය වෙනුවෙන්ම ගන්නා බව.
(ii) සාමූහික ගිවිසුම මගින් ආයතනයේ 14 ශ්‍රේණිය හා ඉන් පහළ ශ්‍රේණීන් ආවරණය වූ බව.
(iii) වගඋත්තරකරුවන් 14 ශ්‍රේණියේ ඇතැම් අය වෙත රු, 10,000/- ක දීමනාවක් ගෙවූ බව.
(iv) එකම සාමූහික ගිවිසුමකින් ආවරණය වන ලද 14 ශ්‍රේණියේ ඇතැම් සේවකයින් කොටසක් වෙත රු, 10,000/- දීමනාව ගෙවන බව.
(v) ගාල්ල කර්මාන්ත ශාලාවේ සේවකයින් හට ඉන්ධන දීමනා ලබා නොදුන් බව.
(vi) සාමූහික ගිවිසුමකින් සියලු සේවකයින් බන්ධනය වී තිබිය දී තෝරාගත් සේවක කාණ්ඩයකට රු. 10,000/- දීමනාව ලබා දුන් බව.
(vii) සේවකයින් ශ්‍රේණි 8, 9, 10, 11, 12, 13, 14 ලෙස පවත්වාගෙන ගිය බව (උදා: හේතු දැක්වීමේ ප්‍රකාශය)
(viii) සේවකයින් සඳහා නිල නිවාස දී තිබූ බව.
(ix) සේවක ප්‍රමාණය සඳහා බස් රථ යොදවා තිබූ බව.
(x) සේවක දරුවන් වෙත පාසල් බස්රථ ලබා දී තිබූ බව.
(xi) නොමිලේ ජලය සපයා තිබූ බව.
(xii) ඉන්ධන දීමනාවක් ඇතැම් සේවක මහතුන්ට ලබා දුන් බව.
(xiii) ඇතැම් සේවකයින්ට යතුරුපැදි ලබා දී තිබූ බව.
(xiv) ඉහළ පෙළේ කළමනාකරුවන් සිය පෞද්ගලික රථ ප්‍රයෝජනයට ගෙන සේවයට පැමිණි බව ආදිය වේ.

වගඋත්තරකාර පාර්ශ්වයේ ලිඛිත දේශනවල ඇතුළත් කරුණු ද සැලකිල්ලට ගත යුතුව ඇත. එනම්,

I. FML සේවකයින් හා NML සේවකයින් රැකියා විස්තර කිරීමේදී වෘත්තීය සුදුසුකම් අනුව, රැකියාවේ වගකීම් අනුව, සහ ඔවුන් භුක්ති විඳිනු ලබන වෙනත් ප්‍රතිලාභ මත සම්පූර්ණයෙන් වෙනස් බව, කළමනාකාරිත්ව ශ්‍රේණියේ අය සමාගම විසින් හඳුනාගන්නා ලද අවස්ථාවෙහි දී භුක්තිවිඳින ලද වරප්‍රසාද සහ සාමූහික ගිවිසුම අත්සන් කරන ලද වෘත්තිය සමිතිය සතුව FML යන ශ්‍රේණියේ එකම සාමාජිකයෙකු පමණක් ඉදිරි පෙළ කළමනාකරුවන්ගෙන් සමන්විත තත්ත්වයේ සිටීමත් අනිකුත් අය කළමනාකරණ නොවන මට්ටමේ අයගෙන් සමන්විත වීම යන කරුණු කෙරේ වගඋත්තරකාර පක්ෂය සැලකිල්ල දක්වා තිබීම,

II. NML හෙවත් කළමනාකරණ නොවන ශ්‍රේණි යන්න ආයතනයේ වාහන ක්‍රියාකරුවන්, මෙහෙයුම් ක්‍රියාකරුවන්, කය වෙහෙසා වැඩ කරන නැතිනම් වෙල්ඩින් ෆිට්න් මැෂින්, ලේත්, මැෂින්කරුවන්, පිටර්, වෙල්ඩර් ආදී අය, බර වාහන ක්‍රියාකරුවන් බවත් ඉහළ කළමනාකරණ ශ්‍රේණිය (FML) ලෙස සුපරීක්ෂක නිලධාරිවරු, ආදීහු බවත්,

III. වගඋත්තරකරු සිය ස්ථාවරයන් පැහැදිලි කිරීම සඳහා ප්‍රධාන ගොනුවෙන් උපුටාගන්නා ලද ඡේද පිටු අංක හා නඩු දිනයන් වෙනස්ව පැවතුණි. වගඋත්තරකරුගේ සාක්ෂිකරු විසින් ප්‍රකාශකළ පරිදි NML සේවකයින්ගේ ප්‍රවාහන වියදම් ලෙස දළ වශයෙන් රුපියල් දස ලක්ෂ 1.5 හෝ දස ලක්ෂ 2ක වැයබරක් නිවෙස්වල සිට කර්මාන්ත ශාලාව තෙක් ප්‍රවාහනය කිරීම සඳහා වගඋත්තරකරුට දැරීමට සිදුවන බවත් FML සේවකයන් තමන්ගේ වාහන වලින් ගමන්කරන බවත්, ඔවුන්ගෙන් 26කට පමණක් යතුරුපැදි හා පෙට්‍රල් ලීටර් 23ක් ලබා දී ඇති බවත්, නමුත් පෙට්‍රල් ප්‍රමාණය වැඩිකරන ලෙස ඉල්ලා සිටියෙන් යතුරුපැදි ආපසු ලබාගෙන රු.10,000/ දීමනාව ලබාදුන් බවත් කීය. එසේ වගඋත්තරකරුට පිරිවැයක් දැරීමට සිදුවූයේ සේවක සුභසිද්ධිය සඳහා පමණක් නොව වගඋත්තරකරුගේ ආදායම් ඉලක්ක සපුරාගැනීම සඳහා ද යන බව අමතක නොකළ යුතුය.

වගඋත්තරකරු වෙනුවෙන් ලිඛිත දේශන සමග

A). ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්දේශයක් වූ ''සමාන වටිනාකමක් සඳහා සමාන ගෙවීමක්'' "Equal pay for work of Equal value" යන සිද්ධාන්තය.

B). R1 පරිදි වැටුප, වගකීම්, ප්‍රතිලාභ හා සුදුසුකම් (වෘත්තීය) NML හා FML වශයෙන් වෙන් වෙන්ව ඉදිරිපත් කිරීම.

C). අංක 1789/19 දරන පඩි පාලක සභා ආඥාපනත සම්බන්ධ රජයේ *ගැසට් නිවේදනය*

D). 1953 මැයි 23 දිනැති "Equal Remuneration 1951" දරන ජා.කම්. සංවිධානයේ ලේඛනයේ ව්‍යවස්ථා 1,2,3

E). එප්පාවල නඩුව

F). Case book on FUNDAMENTAL RIGHTS

G). Labour of Sri Lanka

H). ARIYAPALA GUNARATNE *VS* The People's Bank නඩුකරය ආදී දෑ බේරුම්කරණය

වෙත ඉදිරිපත්කිරීම කෙරෙහි කෘතඥ වියයුතු වේ.

කෙසේ වෙතත් ඉහත සඳහන් කළ නඩු වාර්තා හා විශේෂඥ මත මෙම නඩුවේ ප්‍රදානය කෙරෙහි ගලපා බලාත්මක කරගැනීමට ඉඩක් නොවූ බව ප්‍රකාශ කරමි. නඩු ගොනුවේ කාර්යය සටහන් සඳහන් දින හා පිටු අංක එකක් හැර අන් සියල්ලම ප්‍රධාන ගොනුවෙහි සඳහන් නොවීම ප්‍රදානය සකස්කිරීමේ දී අනවශ්‍ය වෙහෙසකට පත් කරන්නක් විය.

කෙසේ වෙතත් තවදුරටත් වගඋත්තරකරුගේ නීතිඥ මහතා 2012 ඔක්තෝබර් 15 වැනි දින ඉදිරිපත් කර ඇති ප්‍රකාශය සැලකිල්ලට ගෙන බලමු. එහි 8 වන, 9 වන, 10 වන සම්ප්‍රකාශ මෙසේය.

8. The ICEU made a request for a transport allowance for non-managerial level employees at hay level 8, 9, 10, 11, 12 Limit the management turned down their request.

9. The non - managerial employees were not entitled to the benefits that the managemet stab was enjoying even prior to the present management talking over.

10. The majority of non managerial employees are working on the general shift and they ae provided with common transport to and from the factory at an expense of above Rs. 1 million per month. Employees working on the other shift are provided with transport at the beginning and end of the shift up Colombo at an expense of over Rs. 5 million per month.

11. Most of the non managerial stab are provided with married and bachelor accommodation within the housing scheme of the company and such employees living in the housing scheme are provided with transport facilities, school bus service for their children and a separate van to go to the weekly fair for children and facilities such as water, sport, etc, free of charge.

In the circumstance the employees states that the union is not entitled to any relies both in law and in equity and prays ....... මෙම සම්ප්‍රකාශනයන්හි අඩංගු කරුණු මෙසේ සම්පිණ්ඩනය කළ හැක.

(i.) කළමනාකරණ නොවන සේවකයින් ශ්‍රේණි 8, 9, 10, 11, 12 වශයෙන් පැවති බව හා 12 ශ්‍රේණිය ද කළමනාකරණ නොවන ශ්‍රේණියක් බව,

(ii.) කළමනාකරණ නොවන සේවකයින් වෙනුවෙන් ඔවුන්ගේ ගමනාගමනය සඳහා රුපියල් මිලියනයක පිරිවැයක් දරන බව,

(iii.) නුවර සහ කොළඹ සිට සේවකයින් ප්‍රවාහනය සඳහා මිලියන 5 ක මුදලක් මසකට වැය කරන බව,

(iv.) කළමනාකරණ නොවන ශ්‍රේණිවල සේවකයින් සඳහා විවාහ හා තනිකඩ නිල නිවාස සැපයූ බව, පාසල් බස් රථ හා පොළට යාම ඒම සඳහා වෑන් රථයක් සැපයූ බව, ජල හා ක්‍රීඩා පහසුකම් අයකිරීමකින් තොරව සැපයූ බව,

කරුණු මෙසේ වුවද ඉහත දැක්වූ පහසුකම්වලින් එකකුදු දෙපක්ෂයේ සාක්ෂිකරුවන් මගින් හෙළිදරව් නොවූ අතර එකී කරුණු හෙළිදරව් කරගැනීමට කිසිදු සාක්ෂියක් මෙහෙයවා නොතිබූ බව ද සඳහන් කළ යුතු ය.

හෙළි වූ එකම කරුණ වූයේ වගඋත්තරකරුගේ සාක්ෂිකරුවකු ප්‍රවාහන වියදම් සඳහා රුපියල් මිලියන 1.5 හෝ 2 ක පමණ මුදලක් වැය කරන බව පමණි.

එහෙත් එකම අවස්ථාවක දී හෝ එකදු සාක්ෂිකරුවකු හෝ වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් ඉහත සම්ප්‍රකාශයන්හි අඩංගු කරුණු හෙළිදරව් කොට සාක්ෂි ලබා නොදුනි.

සැලකිය යුතු කරුණක් වනුයේ මෙම ප්‍රකාශය ඉදිරිපත් කරන ලද 2012 ඔක්තෝබර් 15 දිනය වන විට වගඋත්තරකාර පාර්ශවය හා වෘත්තීය සමිතිය අතර කම්කරු කොමසාරිස්තුමා දැනුවත්ව, සාමූහික ගිවිසුමක් 2006.06.01 සිට 2008.05.31 දක්වා අත්සන් කර තිබීම හා එහි බලාත්මකභාවය අමතක කිරීමය.

එසේ හෙයින් යොමුවේ සඳහන් කරුණ කෙරෙහි නැවත මෙනෙහි කරමු. එනම්,

''හොල්සිම් ලංකා ලිමිටඩ් ආයතනයේ නිෂ්පාදන මෙහෙයුම් කටයුතුවල නියැලෙන ෆෝමන් හා සුපවයිසර් යන සේවා කාණ්ඩවල සුපරීක්ෂක (14 ශ්‍රේණියේ) සේවකයින්ට ලබා දෙන රු. 15,000 සංශෝධිත රු. 10,000 ක දීමනාව, නිෂ්පාදන මෙහෙයුම් කටයුතුවලට දයකත්වය දැක්වීම යන පදනම මතම එම සේවා කාණ්ඩවලට අයත් පහළ ශ්‍රේණිවල සේවකයින්ට ලබා නොදීම සාධාරණ ද? නැතහොත් ඔවුන්ට ලබා දිය යුතු සහන කවරේ ද, යන්න පිළිබඳව වේ.''

වගඋත්තරකාර ආයතනයේ නිෂ්පාදන මෙහෙයුම් කටයුතු කෙරේ එම ආයතනයේ 10, 11, 12, 13 හා 14 යන සියලුම ශ්‍රේණීන්හි සේවකයින් දායක වන බැව් විභාගය පුරාවට පවත්වන ලද සාක්ෂිවලින් හෙළි වූ කරුණක් වුවද 14 වන ශ්‍රේණියට පමණක් නිෂ්පාදන මෙහෙයුම් කටයුතුවලට දයකත්වය දැක්වීම යන පදනම මත රු. 10,000/ ක (වර්තමානයේ රු. 18,000ක) අතිරේක දීමනාවක් ගෙවීම සාධාරණ නොවන බැව් තීරණය කරමි.

වගඋත්තරකරු හා අන්තර් සමාගම් සේවක සංගමය අතර අත්සන් කරන ලද සාමූහික ගිවිසුම් (X1 හා X3) මගින් දෙපාර්ශවය ක්‍රියාකළ යුතු ආකාරය සම්බන්ධව බැඳීමක් පවතී. සාමූහික ගිවිසුම් මගින් 14 හා ඉන් පහළ සේවකයින් හට මෙම ගිවිසුම අදාළ බැව් පෙනේ. ඒ අනුව එකී සේවකයින්ගේ වැටුප්, බෝනස් ආදී වරප්‍රසාද කෙරෙහි එකී සාමූහික ගිවිසුම බලපානු ලබයි. ඒ අනුව හොල්සිම් සමාගමෙහි මෙහෙයුම් කටයුතුවල නියැලෙන ෆෝමන් හා සුපවයිසර් යන සේවා කාණ්ඩවල සුපරීක්ෂක (14 ශ්‍රේණියේ) සේවකයින්ට ලබා දෙන රු. 10,000 දීමනාව නිෂ්පාදන මෙහෙයුම් කටයුතුවලට දයකත්වය දැක්වීම යන පදනම මතම එම සේවා කාණ්ඩවලට අයත් පහළ ශ්‍රේණිවල සේවකයින්ට ලබා නොදීම අසාධාරණ බැව් තීරණය කරමි.

එබැවින් එම සේවා කාණ්ඩවලට අයත් පහළ ශ්‍රේණිවල එනම් 12 ශ්‍රේණියෙන් පහළ සියලුම ශ්‍රේණිවල සේවකයින්ට වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥ මහතාගේ ප්‍රකාශය පරිදි 8, 9, 10, 11, 12, 13 ශ්‍රේණිවල සේවකයින්ට ද 14 ශ්‍රේණියේ සේවකයින් වෙත ලබාදෙන රු. 10,000 දීමනාව පෙරදැතම කොට ගෙවීම යුක්තිසහගත වේ. ආයතනයේ රු. 10,000 නොලද එහෙත් මෙම ප්‍රදානයෙන් එකී රු. 10,000ට සුදුසුකම් ඇති සේවකයන් වෙත ගෙවිය යුතු මුදල මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ ගෙවීම සඳහා තැන්පත් කළ යුතු ය. ඒ සඳහා පියවර මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී මසක් තුළ ගෙවීමට කටයුතු යොදන ලෙස මෙම බේරුම්කරණයේ වගඋත්තරකරු වන සියැම් සිටි සිමෙන්ට් (පුද්ගලික) සමාගම වෙත නියෝග කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්තිසහගත බැව් සහතික කරමි.

2017 ජුනි මස 14 වැනි දින.

එස්. කාරියවසම්,
කාර්මික අධිකරණයේ
බේරුම්කාර මණ්ඩලයේ සාමාජික.

02 - 71

මගේ අංකය: අයිආර්/22/10/2009.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.03.18 දිනැති හා අංක 1958/64 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.03.15 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මඩකලපුව, සින්නලෙබ්බෙ වීදිය, අංක 02 හි පදිංචි එම්.අයි.වී. මුනීර් මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.11.02 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජනවාරි මස 15 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

*එක් පාර්ශ්වයක් වශයෙන්,*
එම්. අයි. වී. මුනීර් මයා,
අංක 02, සින්නලෙබ්බෙ වීදිය,
මඩකලපුව.

*ඉල්ලුම්කරු* ,

නඩු අංකය : ඒ /3637

එදිරිව

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*වගඋත්තරකරු*

වගඋත්තරකරු අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධවයි.

**තීන්දුව**

ඉහත අංක දරන නඩුවේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා, අංක අයිආර්22/10/2009 සහ 2016.03.15 දිනැති ලිපිය මගින් එකී ගරු අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා හට 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පහත නම් සඳහන් මා පත් කර ඇත.

2 ඉහත කී ගරු අමාත්‍යවරයා විසින්ම එතුමාගේ අංක අයිආර්22/10/2009 හා 2016.03.15 දින දරන ලිපිය මගින් මීට පෙර මෙම කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඩබ්ලිව්. ජී. ඩීන් මහතා වෙත යොමු කිරීම 2010.08.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර ඇත.

3 එකී ආරාවුල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්ගේ අංක අයිආර් 22/10/2009 හා 2016.02.12 දිනැති ලිපිය මගින් ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

1 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මඩකලපුව ඩිපෝවට අනුයුක්තව අභ්‍යන්තර විගණක පරීක්ෂකවරයෙකු වශයෙන් සේවය

කරන එම්. අයි. වී. මුනීර් මහතා සම්බන්ධයෙන් අංක ශ්‍රී ලංගම/නැප්‍රා/2007/01 හා 2007.11.07 දිනැතිව එහි අභියාචනා මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන ලිපිය මගින් මුනීර් මහතාට එරෙහිව නගා ඇති සියළුම චෝදනා වලින් නිදහස් කර ඇති හෙයින් එම තත්වය සැලකිල්ලට ගෙන ඔහුගේ වැඩ තහනම් කර තිබූ 2007.02.12 දින සිට 2007.08.31 දින දක්වා වූ කාලසීමාව සඳහා හිඟ වැටුප් ලබා ගැනීමට ඔහුට හිමිකම් ඇත්ද යන්න හා එලෙස හිමිකම් ලබන්නේ නම් එය කුමන ප්‍රමාණයක මුදලක් විය යුතුද යන්න පිළිබඳව වේ යනුවෙන් දක්වා ඇත.

4 මෙම නඩුව සම්බන්ධයෙන් අදාළ ප්‍රකාශ ගොනු කිරීම සඳහා කාර්මික අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අංක A3637 හා 2016-03-28 දරන ලිපිය මගින් දෙපාර්ශවයෙන්ම පළමු ප්‍රකාශය ගොනු කරන ලෙස දන්වන ලදුව වගඋත්තරකරුගේ 2016-04-11 දිනැති පළමුවන ප්‍රකාශයේ දක්වා ඇත්තේ මෙම නඩුව මීට පෙර A3342 යටතේ 2014-06-26 දින කැඳවන ලදුව ඉල්ලුම්කාර පාර්ශවය විසින් ඒ වන විට තමන්ට ඇති ආර්ථික දුෂ්කරතා සහ වෙනත් පුද්ගලික අපහසුතා මත තවදුරටත් එකී නඩුව පවත්වාගෙන යා නොහැකි බවත් වගඋත්තරකාර පාර්ශවය සමථයකට එළඹීමට හැකියාවක් පවතින බවත් තමන්ට සිදුවූ අගතිය සම්බන්ධයෙන් යම් මුදලක් අයද සිටින බවත්ය. ආයතනයේ ප්‍රතිපාදන පෙන්වා දීම මත ඉල්ලුම්කරු විසින් එකී ඉල්ලීමද ඉවත් කර ගැනීමෙන් පසු ඉල්ලුම්කරුට මෙම සිද්ධියට අදාළව නැවත කිසිදු ප්‍රශ්ණගත කිරීමක් හෝ ආයතනික වශයෙන් පළිගැනීමක් හෝ ඉල්ලුම්කරුට විරුද්ධව මෙම ප්‍රශ්නගත කරුණට අදාළව අධිකරණ ක්‍රියා මාර්ගයක් ගැනීමට වගඋත්තරකරු ක්‍රියා නොකරන්නේ නම් සමථයකට පත්කර ගැනීමට ඉල්ලුම්කරුද කැමැත්ත පළකර සිටි අතර වගඋත්තරකරුද ඊට එකඟත්වය පළ කිරීම මත එකී කාර්මික ආරවුල සමථ වීමෙන් අවසන් වූ බවත් ඊට අදාළව එකී බේරුම්කරණයේ 2014-06-26 වෙනි දින දරන කාර්යය සටහන් පත්‍රයේද ඡායා පිටපතක් ඒ සමඟ අමුණා ඉදිරිපත් කර ඇත.

5 මේ අනුව මෙම නඩුව 2017-02-16 වන දින යලිත් කැඳවූ අවස්ථාවේදී වගඋත්තරකාර පක්ෂය නඩුවට අදාළ කරුණු ඉදිරිපත් කිරීම සඳහා කෙටි දිනයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටි බැවින් 2017-04-04 දින පස්වරු 2.30ට නඩුව යළිත් කැඳවීමට බේරුම්කරණය නියම කර ඇත.

6 එදිනද ඉල්ලුම්කරු වෙනුවෙන් ඉල්ලුම්කරු පෙනී සිට නොමැති අතර ඔහු වෙනුවෙන් නීතිඥ පුන්නිදසේකරන් මහතා පෙනී සිට ඇත. වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් වගඋත්තරකාර මණ්ඩලයේ සහකාර නීති නිළධාරිණී මොනිකා රත්නායක මහත්මිය පෙනී සිට ඇත. එම මහත්මිය මෙම නඩුව ඉහත පරිදි A 3342 යටතේ බේරුම්කාර ඩීන් මහතා ඉදිරියේ අවසාන වී ඇති බව ඉල්ලුම්කරුගේ නීතිඥ මහතා මෙන්ම වගඋත්තරකාර මණ්ඩලය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහත්මියද ප්‍රකාශ කර ඇත. එසේම මෙම නඩුව සම්බන්ධයෙන් ප්‍රදානයක් හෝ නියෝගයක් ගැසට් කර නොමැති බවද ප්‍රකාශ කර ඇත.

7 කෙසේ වෙතත් ඉල්ලුම්කරු පෙනී සිට නොමැති බැවින් නඩුව 2017-05-09 දිනට කල්දමා ඇති අතර එදින අවසන් කිරීමටද බේරුම්කරණය තීරණය කර ඇත. තවද එදින ඉල්ලුම්කරු පැමිණිය යුතු බවද දක්වා ඇත.

8 මේ අනුව 2017-05-09 වන දින නඩුව කැඳවූ අවස්ථාවේදී ඉල්ලුම්කරු පැමිණ සිටි අතර ඔහු වෙනුවෙන් නීතිඥ පුන්නිදසේකරන් මහතා පෙනී සිට ඇත. වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් කල්මුනේ ඩිපෝ කළමණාකාර වී ජවුපර් මහතා පැමිණ ඇති අතර එකී වගඋත්තරකාර මණ්ඩලය වෙනුවෙන් එකී ගමනාගමන මණ්ඩලයේ සහකාර නීති නිළධාරිනී මොනිකා රත්නායක මහත්මිය පෙනී සිට ඇත.

9 මේ අවස්ථාවේදීද ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ තමන්ට සිදුවුවක් මෙන් මෙම මණ්ඩලයේ වෙනත් සේවකයෙකුගෙන් පළිගැනීම සිදු නොකරන ලෙසත් ඒ බව දැනටමත් තමන්ගේ 2014-04-01 දින දරන ලිපිය අනුව සමථයක් වී අවසන් වී ඇති බවය. කෙසේ වෙතත් ඉල්ලුම්කරු විසින් කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් කළමනාකාරිත්වය වෙත දැනුම් දීමට වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥවරිය එකඟ වී ඇත.

10 මේ අනුව ඉල්ලුම්කරු සමථය පිළිගත් බැවින් මෙම නඩුව එතෙකින් අවසන් කර ඇත.

11 මේ අනුව මෙය සාධාරණ හා යුක්තිසහගත තීන්දුවක් කොට මම සලකමි.

පී දනන්සූරිය,
බේරුම්කරු.

වර්ෂ 2017ක්වූ නොවැම්බර් මස 02 වන දින,
කොළඹ දී ය.

02 - 72

මගේ අංක: අයිආර්/10/54/2010.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2013.03.01 දිනැති හා අංක 1799/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.02.18 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අම්බලන්ගොඩ, කළුවඩුමුල්ල, ග්‍රාමිණී විද්‍යාල මාවත, අංක 5/7 හි පදිංචි එන්. සී. බන්දුරත්න මයා. හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, උද්‍යාන පාර, අංක 241 හි පිහිටි ජාතික ගමනාගමන කොමිෂන් සභාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.06.13 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජනවාරි මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය: අයිආර්/10/54/2010.

**කාර්මික අධිකරණයේ දී ය.**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*
එන්. සී. බන්දුරත්න මයා.,
අංක 5/7, ගාමිණී විද්‍යාල මාවත,
කළුවඩුමුල්ල,
අම්බලන්ගොඩ.

*පළමු පාර්ශවය*

නඩු අංකය : ඒ /3502

සහ

ජාතික ගමනාගමන කොමිෂන් සභාව,
අංක 241,
උද්‍යාන පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශවය*

අතර පවතින කාර්මික ආරවුල පිළිබඳවයි.

**ප්‍රදානය**

කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 සහ 1968 අංක 04 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව, උක්ත ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2013.02.18 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත් කොට, මා වෙත යොමු කර ඇත.

**ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස්වරිය විසින් 2013.01.27 දින එවා ඇති ලිපියේ දැක්වෙන්නේ,

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ III ශ්‍රේණියේ අභ්‍යන්තර විගණක (ආවරණ) ලෙස සේවය කරමින් සිටි IV ශ්‍රේණියේ එන්. සී. බන්දුරත්න මහතා හට ආයතනයේ III ශ්‍රේණියේ අභ්‍යන්තර විගණක තනතුර සඳහා බඳවා ගැනීමේ දී උසස්වීම ලබා නොදීම තුළින් යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා එසේ වූයේ නම් ඔහුට හිමි විය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

**පසුබිම**

ඉල්ලුම්කරු විසින් 2013.03.04 දින පිටපත් තුනකින් යුතුව විස්තර ප්‍රකාශය පිටු පහකින් සමන්විතව ඉදිරිපත් කරන ලදී. වර්ෂ 2013.04.22 වැනි දින කාර්මික අධිකරණයේ දී වගඋත්තරකාර පක්ෂය වෙනුවෙන් පෙනී සිටියෙන් රම්‍යා ප්‍රියසේකර මහත්මිය නීතිපති උපදෙස් ලබාගැනීමට අවශ්‍ය බවත් ඉල්ලුම්කරුගේ ප්‍රකාශයේ පිටපත් නොලැබුනු බවත් දන්වන ලදී. වගඋත්තරකරුවන්ට ඉල්ලුම්කරුට පිටපතක් සහිතව 2013.05.13 වැනි දින වන විට උත්තර ප්‍රකාශය ගොනු කිරීමට යොමු කරන ලදී. 2013.05.10 වැනි දින වගඋත්තරකරුවන්ගේ නීතිඥ තැන සති 02ක කාලයක් උත්තර ප්‍රකාශය සඳහා අයැදීය. 2013.05.31 වැනි දින පිටපත් 03 ක් සහිතව පිළිතුරු ප්‍රකාශය ගොනු කරන ලදී. 2013.07.24 වැනි දින විමසීමට ගත් අවස්ථාවේ දී ඉල්ලුම්කරු නීතිඥ සහාය ලබා ගැනීමට අපේක්ෂා කරන බවත්, ආයතනය සමග සාකච්ඡා කර සානුකම්පිතව සළකා බලන ලෙසත් ඉල්ලුම්කරුගේ නීතිඥවරයා දැනුම් දුනි.

2013.09.04 වැනි දින විමසීමට ගත් අවස්ථාවේ දී ඉල්ලුම්කරු පෞද්ගලිකවම පෙනී සිටිය අතර වගඋත්තරකරුවන් වෙනුවෙන් රජයේ නීතිඥ දිස්නා ප්‍රනාන්දු මහත්මිය පෙනී සිටින ලදී. මේ අවස්ථාවේ දී රජයේ නීතිඥවරිය ඉල්ලුම්කරුගේ අයදුම්පත්‍රය ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් දැන්වීමට අනුකූල නොවන බැවින් මූලික සුදුසුකම සපුරා නොමැති බැවින් මුල් අවස්ථාවේදීම ඉල්ලීම ඉවත දැමිය යුතු බවට කියා සිටී. ඉල්ලුම්කරු කියා සිටින්නේ දැන්වීමේ තුන්වන කොටසේ තුන්වන ශ්‍රේණිය අභ්‍යන්තර විගණක තනතුර යන තනතුර සඳහා සුදුසුකම් නැති බවත් එහි සඳහන් පිළිගත් ගණකාධිකරණ ශිල්පීය ආයතනයකින් ලබා ගත් අන්තර් මාධ්‍ය පරිමාණයේ විභාගය සමත්වී තිබීම තමන් සතු බවත් ඊට අමතරව ගණකාධිකරණ හා විගණක ක්ෂේත්‍රයේ වසර හතරක පළපුරුද්ද ලබා ඇති බවත්ය. එම කරුණු සාධනය කිරීම සඳහා 1976.06.28 බදුල්ල බහු තාක්ෂණික ආයතයෙන් ද 1987.10.09 දින සහ 1977 වර්ෂයේ ප්‍රතිඵල ලේඛනය ද ඉදිරිපත් කර සිටී. ඒ ලේඛන අනුව උසස් ජාතික ගණකාධිකාරී ඩිප්ලෝමා පාඨමාලාවේ පළවන දෙවන හා තුන්වන වසර සමත් වී ඇති බවට කරුණු දක්වන ලදී.

මී ලඟ විමසීම් දිනය වූ 2013.10.04 වන දිනය වන විට අදාළ ලේඛන ලැබී නොතිබුණද විමසීම ආරම්භ කරන ලදී. විමසීම ආරම්භයේදී වගඋත්තරකාර පක්ෂය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරිය මූලික සුදුසුකම් සපුරාලිය යුතු පමණින් ම තනතුරකට යම් පුද්ගලයකු බඳවා නොගන්නා බවත් ඉදිරිපත් කර ඇති සුදුසුකම් කෙරෙහි සලකා බලා එම තනතුර පුරප්පාඩු වූ බවත් සඳහන් කරන ලදී. මේ අවස්ථාවේදී ඉල්ලුම්කරු තනතුරේ පුරප්පාඩුව වසර ගණනක් ආවරණය කළ බවත් ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් අනුව සුදුසුකම් මත අයදුම් පත්‍රයක් යොමු කළද සම්මුඛ පරීක්ෂණයට නොකැඳ වූ බවත් එම තනතුරට වෙනත් අයෙකු පත් කර ගත් බවත් ඉන් පසුව තමන්ව එම තනතුරෙන් ඉවත් කළ බවත් තවදුරටත් කරුණු දක්වමින් ඉල්ලුම්කරු 2011.07.18 වන දින අධ්‍යක්ෂ ගමනා ගමන මණ්ඩලය ජාතික කොමිෂන් සභාව වෙත යොමු කරන ලද ලිපිය අනුව 2008.09.01 වන දින සිට 111 වන ශ්‍රේණියේ පිහිටුවීමත්, 2011 අගෝස්තු මාසයේ සිට නව ශ්‍රේණියට අදාළ වැටුප් පිළිබඳව දන්වා පිටපත් සහිතව ලිපියක් එවන ලද බවත් ඒ අනුව කටයුතු නොකිරීම නිසා මෙම ප්‍රශ්නය බේරුම් කරණය වෙත ඉදිරිපත් කළ බවත් අයදුම් පත්‍රයේ සහන ලබා දෙන ලෙස දන්වන ලදී. මෙම අවස්ථාවේදී හරස් ප්‍රශ්න සඳහා වගඋත්තරකාර පක්ෂය දින අයදින ලදී.

වගඋත්තරකාර පක්ෂය වෙනුවෙන් දන්වා සිටියේ 2012.09.26 දිනැති ලිපිය සහ වගඋත්තරකාර පක්ෂය වෙත ලැබී ඇති ලිපිය අතර පරස්පර විරෝධීතාවයක් ඇති බවයි.බේරුම්කරු විසින් අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති බව දක්වමින් ලේඛනයේ නිරවද්‍යතාවය සලකා බැලීමට සතියක කාලයක් ලබාදුනි. කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරී විසින් 2013.09.11 දිනැති ලිපියෙන් සහතිකයේ නිරවද්‍යතාවය දන්වන ලෙස ගාල්ල උසස් තාක්ෂණ ආයතනය වෙත දැනුම් දුනි.

2013.10.01 වන දින උසස් අධ්‍යාපන ආයතනයේ වැඩ බලන අධ්‍යක්ෂක කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරී වෙත ලිපියක් යොමු කරමින් සහතිකයේ නිරවද්‍යතාවයත් එම සහතිකය 1996 වසරේ නිකුත් කරන ලද ගැසට් නිවේදනයකින් කාර්මික විද්‍යාලවල සියලුම උසස් ජාතික පාඨමාලා ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයට පවරා ගත් බවත් දන්වන ලදී. තවද මෙම පාඨමාලා සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් වාර්ෂිකව සිසුන් බඳවා ගැනීමේදී ගැසට් නිවේදනයක් අනුව බඳවා ගැනීම් සිදු කරන අතර ගණකාධිකාරී ශිල්පීය ආයතනයට (A.A.T.) එම පාඨමාලා සම්පූර්ණයෙන් සමත් සිසුන් උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු වසර නිදහස් කර බඳවා ගනු ලැබේ. තවද 1990 අංක 46/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 යටතේ නිදහස් කරන ලද සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ යොමු අංක කා.අ. 5/14/7 දරන චක්‍රලේඛයට අනුව බඳවා ගැනීමේ පටිපාටියට ඇතුළත් කළ යුතු වෙනත් අධ්‍යාපන සුදුසුකම් යටතේ මෙම පාඨමාලාවේ දෙවන වසර සමත් වීම පිළිගත් විශ්ව විද්‍යාලයක ප්‍රථම හෝ මධ්‍යම සහතික ලෙස පිළිගැනීම නිර්දේශ කර ඇත. තවද 2012.04.27 වන දින රජයේ ගැසට් නිවේදනය මගින් ද රජයේ විගණන සේවයට බඳවා ගැනීම්වලදී උසස් ජාතික ගණකාධිකරණ මධ්‍ය පරීක්ෂණයෙන් සමත් වීම අදාළ කරගෙන ඇත යනුවෙන් සඳහන් කරමින් ඇමුණුම් 01, 02, 03 සහ 04 යනුවෙන් අදාළ ලේඛනය ඉදිරිපත් කර ඇත.

2014.05.30 වන දින විමසීමට ගත් අවස්ථාවේදී රජයේ නීතිඥ දිස්නා ප්‍රනාන්දු මහත්මිය හරස් ප්‍රශ්න ආරම්භ කරන ලදී. හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඉල්ලුම්කරු 1994 සිට පොත් තැබුම්කරු වශයෙන් බැඳිලා පසුව ගිණුම් කටයුතු කළා. 2001 වසරේ සිට

හතරවෙනි ශ්‍රේණියේ උසස්වීමක් ලැබිලා ගිණුම් සහකාර වශයෙන් කටයුතු කළා යනුවෙන් පිළිතුරු දී ඇත.

ජාතික ගමනා ගමන කොමිෂන් සභාව ප්‍රසිද්ධ පුවත්පතක දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කළා අභ්‍යන්තර විගණක තනතුරට බඳවා ගැනීමක් සිදුකරන ලද බවට ඉල්ලුම්කරු තමා වෙනුවෙන් පිළිතුරු දී ඇත. වග උත්තරකාර පක්ෂය ඉදිරිපත් කළ පුවත්පත් නිවේදනය ඉල්ලුම්කරු විසින් පිළිගන්නා ලදී. ඉල්ලුම්කරු වැඩිදුරටත් පිළිතුරු දෙමින් ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රයට සම්මුඛ පරීක්ෂණයට කැඳවීමක් නොකළ බවද අවධාරණය කරන ලදී.

2014.05.30 වන දින 05 පිටුවේ හතරවෙනි ප්‍ර:

අභ්‍යන්තර විගණක තනතුරේ වැඩ ආවරණය උදෙසා ඔබට කිසිදු අමතර දීමනාවක් ලබා නොදෙන බව ලිඛිතව දන්වා තිබිය දී එම තත්ත්වයට එකඟව කටයුතු කිරීමට ඔබ විසින්ම පිළිගෙන තිබියදී මානුෂීය තත්ත්වය සලකා අදාළ තනතුරේ රාජකාරිය ආවරණය කිරීම උදෙසා වගඋත්තරකාර ආයතනය විසින් වැටුප් වර්ධක හතරක් ඔබට ප්‍රදානය කළ බව ඔබ පිළිගන්නවා ද?

05 පිටුවේ හතරවෙනි උ:
2003 සිට 2007 දක්වා වර්ෂ හතරක් ගියාට පසුව කාර්යක්ෂමව වගකීමෙන් වැඩ කළ නිසා සානුකම්පිතව, දක්ෂතාව සලකා වැටුප් වර්ධක 04 ක් ලබා දුන්නා.

2014.10.02 වන දින වගඋත්තරකාර පාර්ශවයෙන් නඩුව ආරම්භ කරන ලදී. සහකාර අධ්‍යක්ෂ පරිපාලන ඩබ්. බී. දැල්පිටිය මහතා මූලික සාක්ෂි දෙමින් ඉතා පැහැදිලිවම බන්දුරත්න මහතා පොත් තබන්නන්ගේ තනතුරේ පස්වෙනි ශ්‍රේණියට පත්වීම ලැබුණු බව R1 ලිපිය ඉදිරිපත් කරමින් සාක්ෂි දුනි. 2001 වසරේ බන්දුරත්න මහතාට උසස්වීමක් ලැබුණු බවත් අභ්‍යන්තර විගණක තනතුරේ වැඩ ආවරණය කිරීමට පත්කළ බවත් පැවසීය. 2003.07.10 වන දින සිට 2008 දක්වා බන්දුරත්න මහතා රාජකාරි කටයුතු ආවරණය කළ බව සාක්ෂිකරු අවධාරණය කරන ලදී. සාක්ෂිකරු බන්දුරත්න මහතා 2004.03.10 වන දින ජාතික ගමනා ගමන කොමිෂන් සභාවෙන් දීමනාවක් ලිඛිතව ඉල්ලා සිටි බවත් ලිපි ලේඛන R6 ලෙස ලකුණු කරන ලදී.

මෙම විමසීමේදී ඉල්ලුම්කරු සහ සහකාර අධ්‍යක්ෂක පරිපාලන දෙදෙනා පමණක් සාක්ෂි දුනි. දෙපාර්ශවයේම සාක්ෂි අනුව පැහැදිලි වූ කරුණක් වන්නේ ඉල්ලුම්කරු පොත් තබන්නන් පස්වන ශ්‍රේණියේ තනතුරට පත් වී එම කාර්යයේ යෙදී සිටිය දී 2001.12.01 වන දින උසස්වීමක් ලැබුණු බවත් එම කටයුතුවලට පරිබාහිරව අභ්‍යන්තර විගණක තනතුරේ රාජකාරි නොකඩවා වසර 04 ක් ආවරණය කරන ලද බවත් ය. එම කාලය තුළ කිසිම විෂමාචාරයක් හෝ අකාර්යක්ෂමතාවයක් සිදුවනු බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවුණි.

වගඋත්තරකාර පක්ෂයේ අවශ්‍යතාවය මත අභ්‍යන්තර විගණක තනතුර සඳහා ප්‍රසිද්ධ දැන්වීමක් පළ කිරීමෙන් පසු ඉල්ලුම්කරු ද අයදුම්පතක් යොමු කළ ද යටත් පිරිසෙයින් ඉල්ලුම්කරුව සම්මුඛ පරීක්ෂණයට හෝ කැඳවා නොමැත. ඉල්ලුම්කරුට දැන්වීම අනුව අවම අධ්‍යාපනික සුදුසුකම් තිබූ අතර තනතුරේ දීර්ඝ කාලයක් වැඩ කිරීම තුළින් පළපුරුද්ද ද ලබා ඇති බව පැහැදිලි විය.

කෙසේ නමුත් වගඋත්තරකාර පක්ෂය යටත් පිරිසෙයින් ඉල්ලුම්කරුව සම්මුඛ පරීක්ෂණයට හෝ නොකැඳවීම අසාධාරණ වූත් අයුක්ති සහගත වූත් පරිපාලනමය ක්‍රියාවකි. විමසීමේ දී ඉදිරිපත් වූ කරුණු අනුව වගඋත්තරකාර පක්ෂය ඉල්ලුම්කරුගෙන් උපරිම සේවය ලබාගෙන ඇතත් සේවය පිළිබඳව කිසිදු සළකා බැලීමක් කර නැත. 2014.10.02 වන දින හයවන පිටුවේදී අධිකරණය නැගූ ප්‍රශ්නයකට ප්‍ර: ඉල්ලුම්කරුට හතරවෙනි ශ්‍රේණියේ වැඩ ආවරණය කිරීමේ හැකියාව තිබුණාද?

උ: දන්නේ නැත.

එම පිටුවේම ප්‍ර: අදාළ රාජකාරි කටයුතු කිරීමට බන්දුරත්න මහතාට සුදුසුකම් තිබෙනවාද?

උ: නැත. ආයතනයේ සුදුසුකම් තිබෙන කෙනෙක් බඳවා ගන්නා තෙක් පත් කර තිබෙන්නේ. නිගමන ඉදිරිපත් වූ සාක්ෂි ප්‍රකාශන ලේඛන සහ දෙපාර්ශවයේ ලිඛිත සැළකිරීම් ඇතුළුව බේරුම්කරණ විභාගයේ සමස්ථ ක්‍රියා පටිපාටිය අධ්‍යයනය කිරීමෙන් පසුව කරන ලද නිරීක්ෂණ ඇසුරෙන් පහත සඳහන් නිගමනයන්ට එළඹෙමි.

(i) ඉල්ලුම්කරු වගඋත්තරකාර ආයතනයේ සේවකයෙකු ලෙස අවංකවම සද්භාවයෙන් සේවය කරන ලද බව සහ වගඋත්තරකාර පක්ෂයේ අවශ්‍යතාවය මත වර්ෂ 2003.07.10 වන දින සිට තුන්වන ශ්‍රේණියේ අභ්‍යන්තර විගණක තනතුරේ රාජකාරි කටයුතු 2008 වසර දක්වා ක්‍රමවත්ව ආවරණය කරන ලද බව.

(ii) ඉල්ලුම්කරු ලිඛිතව තමන්ගේ සේවය උදෙසා දීමනාවක් ලබාදෙන ලෙස පාලක පක්ෂයෙන් ඉල්ලා සිටිය ද ඒ සම්බන්ධයෙන් විධිමත් ප්‍රතිචාරයක් නොදක්වන ලද නමුත් අවසානයේ දී විශේෂ වැටුප් වර්ධක 04 ක් ප්‍රදානය කරන ලද බව.

(iii) R2 දරන පුවත්පත් දැන්වීමෙන් පුරප්පාඩුව සඳහා අයදුම්පත් කැඳවූ අතර ඉල්ලුම්කරු ද අයදුම්පතක් ඉදිරිපත් කරන ලද නමුත් විධිමත්ව සම්මුඛ පරීක්ෂණය නොපවත්වන ලද බව 2014.10.02 දින 14 වන පිටුවේ සිට 17 දක්වා පිටුවල ඇති කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමේ දී වගඋත්තරකාර පක්ෂය සාධාරණ සහ යුක්ති සහගත ලෙස පරීක්ෂණ කටයුතු කළ බවට සාක්ෂි ඉදිරිපත් නොවීය.

(iv) මෙම නඩු විභාගය ආරම්භයේ දී ඉල්ලුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම් අභියෝගයට ලක් කරමින් වගඋත්තරකාර පක්ෂය විරෝධතා මතු කරන ලදී. පසුව ගාල්ල උසස් අධ්‍යාපන ආයතනයේ ඉල්ලුම්කරු ඉදිරිපත් කරන ලද සහතිකවල සත්‍ය හා වලංගු භාවයත් එම සහතික සුදුසුකම් පිළිබඳව සෑහීමකට පත්වන බවටත් ලිඛිතව බේරුම්කරණය වෙත කරුණු දක්වා තිබුණි.

**ප්‍රදානය**

1. ඉල්ලුම්කරුගේ පළමුවැනි ඉල්ලීම සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට බේරුම්කරණයට අධිකරණ බලයක් නොමැති හෙයින් එය ඉවතලමි.
2. ඉල්ලුම්කරුගේ දෙවන ඉල්ලීම වන 2003.07.10 වන දින සිට තුන්වන ශ්‍රේණියේ තනතුරේ කටයුතු ආවරණය කිරීමක් කර ඇති හෙයින් එදින සිට තුන්වෙනි ශ්‍රේණිය ලබාදීම ඉවතලමින් ඒ වෙනුවට 2008 දක්වා ආවරණය කර ඇති හෙයින් ඉල්ලුම්කරුගේ ඉල්ලීමේ දින සිට බලපාන පරිදි තුන්වන ශ්‍රේණිය ලබාදීම මෙම ප්‍රදානය මත තුන්වන ශ්‍රේණිය ලබාදුන් දින සිට වැටුපේ වෙනස හිඟ මුදල් ලබාදීම.
3. ඉල්ලුම්කරුගේ හතරවෙනි සහ පස්වෙනි ඉල්ලීම් ඉවතලමි.
4. දීර්ඝ කාලයක් බේරුම්කරණයේ විභාග කටයුතුවලට සහභාගිවීම නිසා වගඋත්තරකාර පක්ෂය විසින් රුපියල් විසි දහසක මුදලක් නඩු ගාස්තු වශයෙන් හිමි විය යුතුයි.
5. මෙකී ප්‍රදානයන් *ගැසට්* පත්‍රයේ පළ වූ දින සිට මසක් ඇතුළත ක්‍රියාත්මක විය යුතුය. මුදල් නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතුය.

*සටහන*

මෙම බේරුම්කරණ විභාගයට සෑහෙන කාලයක් ගතවූයේ දෙපාර්ශවයම වරින් වර දින ඉල්ලා කරන ලද ඉල්ලීම්වල ප්‍රතිඵලයක් හැටියටය. විශේෂයෙන් ම මෙම ප්‍රදානය සකස් කොට ඉදිරිපත් කිරීම ප්‍රමාද වූයේ නොවැළැක්විය හැකි අති පෞද්ගලික හේතූන් නිසා බවත් ඒ සම්බන්ධයෙන් දෙපාර්ශවයට ම කිසියම් අපහසුතාවයක් වූයේ නම් ඒ සම්බන්ධයෙන් පෞද්ගලිකව අතිශයින්ම කණගාටුවට පත් වෙමි.

**එස්. එම්. එස්. ජයවර්ධන**
බේරුම්කරු.

2017 ජුනි 13 වැනි දින කාර්මික අධිකරණයේ දී ය.

02 – 73

මගේ අංකය: අයිආර්/සීඕඑම්/03/කිව්/2014/73

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.02.03 දිනැති හා අංක 1952/36 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2016.01.28 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බත්තරමුල්ල, කෝට්ටගෙවත්ත පාර, අංක. 48/3 හි පදිංචි පී. පී. සේනානායක මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 21 හි පිහිටි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.09.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ඒ. විමලවීර**
කම්කරු කොමසාරිස් ජනරාල්

2018 ක් වූ ජනවාරි මස 15 දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය,

යොමු අංකයඃ අයිආර්/සීඕඑම්/03/කිව්/2014/73.

කාර්මික අධිකරණයේ දී ය.

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

පී. පී. සේනානායක මිය,
අංක 48/3, කෝට්ටගෙවත්ත පාර,
බත්තරමුල්ල.

නඩු අංකය ඃ A/3626

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්,
අංක 21, වෝක්ෂොල් වීදිය,
කොළඹ 02.

අතර පවතින ආරාවුල.

ප්‍රදානයයි

කම්කරු සහ වෘත්තිය සමිති සබඳතා අමාත්‍ය ගරු ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියැවෙන) පනත් වලින් සංශෝධන වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2016.01.28 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

<u>ආරාවුලට හේතු වී ඇති කාරණය</u>

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ:

> ''ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි විධායක III ශ්‍රේණියේ නිලධාරිනියක ලෙස උසස් වීම් ලබා සිටින පී. පී. සේනානායක මහත්මිය එම ශ්‍රේණියට අදාල තනතුරක් සහ ඊට අදාල රාජකාරි ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම යුක්ති සහගත වන්නේ ද සහ එසේ යුක්ති සහගත වන්නේ නම් ඇයට හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ'' යන්නය.

<u>පෙනී සිටීම</u>

මෙම නඩුවේ පළමුවැනි පාර්ශ්වය ලෙස තමාට අසාධාරණයක් සිදුවී යයි පවසමින් සහනයක් පතන පී.පී.සේනානායක මහත්මිය නඩු කටයුත්ත පුරා ම ඊට සහභාගි විය. ආරම්භයේ දී මූලික ප්‍රකාශය සහ දෙවැනි ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ පටන් බේරුම්කරණ විභාගය අවසන් වන දින තෙක් නඩු වාර කීපයක දී හැරුණු විට පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටියේ ඉල්ලුම්කාරිය විසින් බලය පවරන ලද නියෝජිත එස්.පී. විජේමාන්න මහතා ය.

දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් ආයතනයේ සහකාර කළමනාකරු (සේවක සම්බන්ධතා) නීතිඥ ඉඳුනිල් නවරත්න මහතාත්, සේවක සබඳතා සහායක තරිඳු චතුරංග මහතාත්, රහස්‍ය ලේකම් ඩී.එම්.එල්. දිසානායක මහත්මියත් වරින් වර සහභාගී වී ඇත. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් නඩුව ආරම්භ කළ කාලයේ නීතිඥ ඉඳුනිල් නවරත්න මහතා පෙනී සිටියේ ය. පසුව දෙවන පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් විභාගය අවසන් වන තුරු නීතිඥ මලික් හනාන් මහතා පෙනී සිටියේ ය.

<u>නඩු පටිපාටිය</u>

බේරුම්කරණය විභාග පටිපාටිය අනුව පළමුවන සහ දෙවන පාර්ශ්වයන්ට තම ස්ථාවරය දැක්වෙන පළමුවැනි ප්‍රකාශය 2016.02.23 වැනි දින හෝ ඊට පෙර ඉදිරිපත් කරන ලෙස කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරි විසින් 2016.02.09 දින දැනුම් දී ඇත. පළමුවැනි පාර්ශ්වය සතියක අතිරේක කාලයක් ඒ සඳහා ඉල්ලා ගෙන 2016.02.29 දින තම පළමු ප්‍රකාශය භාර දී ඇත. කෙසේ වෙතත් දෙවන පාර්ශ්වයෙන් කිසිදු ප්‍රතිචාරයක් ලැබී නැත.

එම පසුබිම පවතිද්දී මෙම බේරුම්කරන විභාගය 2016.06.24 දින පළමු වතාවට කැඳවනු ලැබුණි. ලබා දිය යුතු පළමුවැනි ප්‍රකාශය ලබා නොදුන්නා පමණක් නොව වගඋත්තරකාර ආයතනය එදින පරීක්ෂණයට සහභාගි වූයේ ද නැත. අඩු තරමින් තමන් ඊට සහභාගි නොවන බව දුරකතනයෙන් දැන්වීමට පවා සමත් නොවී ය.

වගකිවයුතු අර්ධ රාජ්‍ය ආයතනයක් එසේ කටයුතු කිරීම අසතුටුදායක බවට එදින සටහන් කර තබන ලදී. පරීක්ෂණය දෙවන දිනයට 2016.07.21 දින කැඳවන ලද අවස්ථාවේ දී වගඋත්තරකාර පාර්ශ්වය නියෝජනය කරමින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් ආයතනයේ සහකාර කළමනාකරු (සේවක සම්බන්ධතා) නීතිඥ ඉඳුනිල් නවරත්න මහතා පෙනී සිට කරුණු සැළකරන ලදී. දෙපාර්ශ්වයේ එකඟතාව මත කිසියම් සාධාරණ සමථයකට එළඹිය හැකි ද යන්න පිළිබඳ ව උත්සාහයක් ගන්නා ලදී. එබඳු සමථයකට දෙපාර්ශ්වය ගෙන ඒම අපහසු වූයෙන් නඩුවේ කටයුතු ඉදිරියට කරගෙන යාමට තීරණය කරන ලදී. ඒ අනුව නඩුව 2016 ජුනි මස 24, ජූලි මස 21, අගෝස්තු මස 23, සැප්තැම්බර් මස 13, සැප්තැම්බර් මස 19, ඔක්තෝබර් මස 13, දෙසැම්බර් මස 01 සහ 2017 ජනවාරි මස 16 දින යන දිනයන් 08 කට කැඳවා විභාගය පවත්වන ලදී. දින නියම කරන ලද නමුත් 2016 නොවැම්බර් මස 23 දින දී පරීක්ෂණ විභාගය නොපැවැත්විණි.

මෙම බේරුම්කරණ විභාගයේ සාක්ෂි විභාගයන් පැවැත්වුනේ නැත. පළමුවැනි පාර්ශ්වයත් දෙවැනි පාර්ශ්වයත් විසින් පළමු වාර්තා සහ දෙවැනි වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසුව විභාගය ආරම්භ කරන ලද පළමුවැනි දිනයේ දී, එනම් 2016.10.13 දින දෙවන පාර්ශ්වය වන ආයතනය වෙනුවෙන් පෙනී සිටින නීතිඥ මහතා පහත දැක්වෙන මූලික විරෝධතාව ඉදිරිපත් කළේ ය.

''දෙවන පාර්ශ්වය වෙනුවෙන් මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරමින් ඉතා ගෞරවයෙන් ප්‍රකාශ කර සිටින්නේ ඉල්ලුම්කාරිය විසින් ඉදිරිපත් කර ඇති පළමු ලිඛිත ප්‍රකාශයට අනුව ඇය සඳහන් කර ඇත්තේ, ඇය ඉල්ලා සිටිනුයේ උසස් වීමක් නොව උසස් වීමට සරිලන රාජකාරියක් වශයෙනි. එසේ ම පළමු ලිඛිත ප්‍රකාශයේ ම ඇය මෙසේ ද සඳහන් කර ඇත.''

''මා වැඩිදුරටත් කියා සිටින්නේ මාගේ ගැටළුව උසස්වීමක් සම්බන්ධව නොවන අතර ලබා දී ඇති උසස්වීමට අදළ තනතුර හා රාජකාරි ලබා නොදීමය. ලිපිකරු රාජකාරියේ යෙදවීම හා මාගේ ශ්‍රේණියට පහළ ශ්‍රේණියක නිලධාරිනියකගේ (විධායක IV වන ශ්‍රේණිය) යටතේ සේවයේ යෙදවීම බවයි.''

ඇය මෙම ලිඛිත ප්‍රකාශය අවසානයේ දී වයස අවුරුදු 60 සම්පූර්ණවීම වෙනුවෙන් ඇය විශ්‍රාම ගොස් ඇති නිසා ඇයට සිදු වූ අසාධාරණය වෙනුවෙන් රුපියල් 587,151.18ක මුදලක් විකල්ප ලෙස අයැද ඇත. දෙවන පාර්ශ්වයෙන් ඉතා ගෞරවයෙන් කියා සිටින්නේ ඉහත සඳහන් කරන ලද විකල්ප ඉල්ලීම ඉල්ලුම්කාරිය විසින් එම බේරුම්කරණයට අදළ කාරණාව ඉදිරිපත් කිරීමෙන් පසු ව ඇති වූවක් බවත්, මෙම බේරුම්කරණයේ දෙපාර්ශ්වය අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වශයෙන් කම්කරු කොමසාරිස්තුමාගේ 2015.12.21 දිනැති ලිපියේ සඳහන් කාරණාවට පරිභාහිර කරුණක් බවයි. කරුණු එසේ හෙයින් ඉල්ලුම්කාරිය විසින් ඉහතින් සඳහන් කරන ලද විකල්ප ඉල්ලීම හේතුවෙන් මෙම බේරුම්කරණය තවදුරටත් පවත්වාගෙන යා නොහැකි බවට දෙවන පාර්ශ්වය වෙනුවෙන් ඉතා ගෞරවයෙන් කියා සිටින අතර, එකී මූලික විරෝධතාවය මත ඉල්ලුම්කරුගේ ඉල්ලීම මුල් අවස්ථාවේ දී ම නිශ්ප්‍රභා කරන ලෙස ඉතා ගෞරවයෙන් දෙවන පාර්ශ්වය වෙනුවෙන් අයැද සිටී.''

එකී මූලික විරෝධතාව සම්බන්ධයෙන් උත්තරයක් ලිඛිත ව ඉදිරිපත් කිරීමට ඉල්ලුම්කාර පළමුවන පාර්ශ්වයටත්, එකී උත්තරයට ප්‍රතිඋත්තරයක් ඉදිරිපත් කිරීමට දෙවන පාර්ශ්වයේ ආයතනයටත් අවස්ථාව ලබාදෙන ලදී.

ඒවා පදනම් කරගෙන 2017.01.16 වැනි දින බේරුම්කරණ විභාගයේ දී මාගේ පහත සඳහන් නිගමනය ලබාදෙන ලද අතර එය විවෘත ව කියවා ප්‍රකාශයට පත්කොට දිනයේ කාර්ය සටහන් වල වාර්තා කළෙමි.

''ඉල්ලුම්කාරියට 2009.11.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි තුන්වැනි ශ්‍රේණියේ විධායක ශ්‍රේණියට උසස්වීමක් ලබා දුන්න ද එකී ශ්‍රේණියට අදළ තනතුරක් සහ ඊට සරිලන රාජකාරි විෂයන් ලබා නොදුන් බව සඳහන් වන අතර දෙවන පාර්ශ්වයේ ආයතනය ඒ පිළිබඳව හබ කරන්නේ නැත. ආයතනය වෙනුවෙන් කියා සිටින්නේ ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ සේවකයින්ට උසස්වීම් ලබාදීමේ පටිපාටියක් ඇති බවත් ඒ ඒ තනතුරු සඳහා අවශ්‍ය වන අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සපුරාලු විට සම්මුඛ පරීක්ෂණයක් පවත්වා යෝග්‍යතාව මත උසස්වීම් ලබාදීම එකී පටිපාටිය බවත්ය. ඉල්ලුම්කාරිය උසස්වීම් ලැබීමට අවශ්‍ය යෝග්‍යතා මට්ටම් සම්පූර්ණ නොකරන බවත්ය. රාජකාරි ඌනතා තිබූ බවත්, විශේෂයෙන් ම ප්‍රමාද වී රාජකාරියට පැමිණීමේ අධික ප්‍රවණතාවක් දිගින් දිගටම තිබුණු නිසාත් ඉල්ලුම්කාරියට කලින් කලට ලැබිය යුතු උසස්වීම් නොලැබුණු බව දෙවන පාර්ශ්වයේ ප්‍රකාශනවලින් කියා ඇත. කෙසේ වුවද හුදෙක් ජ්‍යෙෂ්ඨත්වය පමණක් සැලකිල්ලට ගෙන ඇයට 2009 වර්ෂයේ දී ඉහත කී තුන්වැනි ශ්‍රේණියේ විධායක ශ්‍රේණියට උසස්වීම ලබා දී ඇති නමුත් එකී ශ්‍රේණියට අදාළ තනතුරක් පිරිනැමීමට තරම් යෝග්‍ය මට්ටමක ඇය නොසිටි බැවින් විධායක තනතුරක් සහ විධායක රාජකාරි කොටසක් පිරිනැමීමට ආයතනයේ පාලන අධිකාරිය තීරණය කර නැති බව කියැවිණි. ඇයගේ සේවයට පැමිණීමේ අසතුටුදායක ප්‍රමාදයන් දැක්වෙන ලේඛන කිහිපයක් R 01 සහ R07 දක්වා වූ ඇමුණුම ලේඛන මගින් ඉදිරිපත් කර තිබූ අතර, තනතුරක් හා ඊට අදාළ රාජකාරි නොපැවරීමට හේතු වූ අනෙකුත් කරුණු දෙවන පාර්ශ්වය විසින් විභාගයක් පැවැත්වුවහොත් ඔප්පු කළ යුතු වූ කරුණකි.

ඉල්ලුම්කාරිය කියා සිටින්නේ එකී ප්‍රමාදයන් විවිධ හේතුන් නිසා ඇති වූ ඒවා බවත් එසේ කලින් කලට තමුන්ට හිමි නිවාඩු වලින් කපා හැරී බවත් ය. තමන් අතින් ඒ හැරුණුවිට වෙනත් රාජකාරි ඌනතා ඇති නොවුනු බව ඇයගේ ප්‍රකාශවලින් කියා ඇත. තවදුරටත් ඉල්ලුම්කාරිය කියා සිටින්නේ මේ සමයේ දී ආයතනයේ පාලන අධිකාරිය අත්තනෝමතිකව ක්‍රියා කරමින් තමුන් ඇතුළු සේවක පිරිසකට අසාධාරණකම් කරමින්, හිතවතුන් පිරිසකට සුදුසුකම් නැතිව පවා උසස්වීම් හා වරප්‍රසාද ලබා දුන් බවයි. තවද අනිසි ලෙස උසස්වීම් සහ වරප්‍රසාද දෙනු ලැබූ බොහෝ පිරිසකගේ නම් සඳහන් කරමින් විස්තර සඳහන් කර ඇතත් පරීක්ෂණයක් පැවැත්වුවහොත් ඒවා ඔප්පු කළ යුතු කරුණු වේ.

ඒ අනුව දෙපාර්ශ්වය දෙවිධියකට කරුණු දැක්වූවත් පැහැදිලි කාරණයක් වන්නේ ඉල්ලුම්කාරිය 2009.11.01 වන දින සිට ක්‍රියාත්මක වන සේ තුන්වැනි ශ්‍රේණියේ විධායක ශ්‍රේණියට උසස් කරනු ලැබූ නමුත් එකී විධායක ශ්‍රේණියට සරිලන තනතුරක් හා රාජකාරී විෂය පද්ධතියක් ලබා නොදුන් බවයි. කාර්මික ආරවුල් පනතේ ''කාර්මික ආරවුලක්'' යන්නට දී ඇති නිර්වචනයට ඇතුළත් වන ආරවුලක් මේ මගින් උපචය වූ බව පැහැදිලිය.

ඉල්ලුම්කාරිය ඉදිරිපත් කළ පලමු ප්‍රකාශයේ II වන ඡේදයේ දෙවැනි කොටසේ ඇයට උද්ගත වූ කාර්මික ආරවුලේ ස්වභාවය සම්පිණ්ඩනය වී ඇත. ඒ මෙසේය.

"මා වැඩිදුරටත් කියා සිටින්නේ මගේ ගැටළුව උසස්වීමක් සම්බන්ධව නොවන අතර ලබා දී ඇති උසස්වීමට අදාළ තනතුරු හා රාජකාරි ලබා නොදී ලිපිකරු රාජකාරියේ යෙදවීම සහ මගේ ශ්‍රේණියට පහළ ශ්‍රේණියක නිලධාරිණියකගේ (විධායක හතරවැනි ශ්‍රේණිය) යටතේ සේවයේ යෙදවීම බවයි."

මෙම පරීක්ෂණය දිගටම පවත්වාගෙන ගොස් ඉල්ලුම්කාරිය විසින් මෙම ස්ථාවරය සාර්ථක ලෙස ඔප්පු කරනු ලැබුවේ වී නම් එම අසාධාරණය මගින් කාර්මික ආරවුලක් උපචය විය හැකිය. එහෙත් ගැටළුව වන්නේ බේරුම්කරණ තීරණයකින් එය නිවැරදි කිරීමට අද අවස්ථාවක් නැත්තේ ඇය මේ වන විටත් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමෙහි සේවයේ නොසිටින බැවිනි. ඉල්ලුම්කාරිය 2016.02.27 දින සේවයෙන් විශ්‍රාම ගොස් ඇත.

කාර්මික ආරවුල් පනතේ 03 (1) අනු වගන්තිය ප්‍රකාරව බේරුම්කරණය විසින් බේරුම් කළ හැක්කේ පවත්නා ආරවුලක් ලෙස පමණකි. දැනට මෙය පවත්නා ආරවුලක් ලෙස සැලකිය නොහැක. අදාළ ආරවුල බේරුම්කරණයට යොමු කරන දිනය වන විට එහි පැවැත්මක් තිබුණු බව සැබෑය. එහෙත් මෙම පරීක්ෂණ විභාගය ආරම්භ වන විටත් මෙම ආරවුලේ පැවැත්ම අවසන් වී ඇත්තේ ඉල්ලුම්කාරිය ඒ වන විටත් සේවයෙන් විශ්‍රාම ගොස් ඇති බැවිනි. මෙහිදී ඉල්ලුම්කාරියට කිසියම් අසාධාරණයක් සිදු වූවා විය හැකිය. මේ ඉල්ලීම ඇය විසින් මුල් අවස්ථාවේදී ඉදිරිපත් කර ඇත්තේ මීට වසර කිහිපයකට පෙර බවද කියවිණි. ඒ කෙසේ වුවත් මෙම බේරුම්කරණයට ඒ හේතුව නිසා අද දින කළ හැක්කක් නොමැත.

දෙවන පාර්ශවයේ මූලික විරෝධතාවට අදාළව ඊලඟට විසඳිය යුතු ප්‍රශ්නය වන්නේ ආරවුල නිසා ඇයට සිදු වී යැයි කියන අසාධාරණය මූල්‍යමය වශයෙන් ගණනය කොට ආයතනයෙන් රු. 587,151.18 / ක මුදලක් ඉල්ලා සිටීම පිළිබඳ ප්‍රශ්නයයි. මෙම මුදල ඉල්ලා සිටින්නේ ද ගෙවිය යුත්තේද "වන්දියක්" වශයෙනි. සැබවින්ම අසාධාරණයක් සිදුවූයේ වුවද එසේ වන්දියක් ගෙවීමේ පදනමකින් ඉල්ලුම්කාරියට මුදලක් ගෙවීම ගණනය කිරීම අපහසු කරුණකි. එකී මුදල ගණනය කරන ආකාරය ඉල්ලුම්කාරිය විසින් ඇයගේ දෙවන ප්‍රකාශයේ දෙවන පිටුවේ අංක 04 යටතේ මෙසේ සඳහන් කර ඇත.

"පහත සඳහන් හේතු මත ඉල්ලුම්කාරියට වන්දි වශයෙන් රු. 587,151.18/ ක මුදලක් (15,000X52 =780,000- 192,848.82) ලැබිය යුතු බැවින් ........... ඒ සඳහා සාධාරණ පරීක්ෂණයක් කරන මෙන් ඉල්ලා සිටින අතර ......"

මෙය ඉතාම විෂය බද්ද වූ කල්පිත ගණනය කිරීමකි. එහිදී රු. 15, 000ක් බැගින් වූ 52ක් ගණන් බලා ඉන් රු. 192,848.82/ක් අඩු කොට එන මුදලක් ලෙස දක්වා ඇත. එය හුදෙක් කල්පිත පදනමක් මත කර ඇති ගණනයක් බව පෙනේ.

පරීක්ෂණය දිගින් දිගටම පවත්වා ගෙන ගොස් සාක්ෂි මගින් ඉල්ලුම්කාරියට බලවත් අසාධාරණයක් සිදුවේ යැයි නිසැකවම ඔප්පු කරනු ලැබුවේ නම් වුවද එක් අතකින් ඇයට අද වන විට විධායක තුන්වැනි ශ්‍රේණියට අදාළ තනතුරක් සහ ඊට සරිලන රාජකාරි ස්වභාවයක් ලබා දීම කළ නොහැක. අනෙක් අතට තමුන්ට වඩා ජ්‍යෙෂ්ඨත්වයෙන් අඩු පුද්ගලයෙකු යටතේ සේවයේ යෙදීමෙන් විය හැකි අගතියක් වූවා යයි පිළිගත හැකි නමුත් අද වන විට සමනය කළ නොහැක. ඇය ඉල්ලා සිටින ආකාරයේ අහිමි වූ තනතුර සහ රාජකාරි ස්වභාවයට සරිලන වන්දියක් ගණනය කිරීමද කළ නොහැක්කකි. ඒ අතර ඉහතින සඳහන් කළ කාර්මික ආරවුල් පනතේ 03 (01) වැනි අනු වගන්තිය ප්‍රකාරව දැනට නොපවතින කාර්මික ආරවුලක් සම්බන්ධයෙන් මෙම පරීක්ෂණය තවදුරටත් පවත්වාගෙන යාම කළ නොහැකි වන අතර එසේ කළහොත් ඉන් ප්‍රතිඵලයක් ද අත් නොවනු ඇත.

එබැවින් දෙවන පාර්ශවය විසින් ගෙන එන ලද මූලික විරෝධතාව පිළිගැනීමට සිදුවන අතර එකී මූලික විරෝධතාවයේ සඳහන් කරුණු ද ඉහත සඳහන් කරන ලද අනෙකුත් කරුණු සැලකිල්ලට ගෙන ඉල්ලුම්කාරියගේ ඉල්ලීම නිශ්ප්‍රභා කොට පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කරමි."

**ප්‍රදානය**

2017.01.16 වැනි දින බේරුම්කරණ විභාගයේ දී මා විසින් විග්‍රහ කිරීමට කර ඇති ඉහත සඳහන් නිරීක්ෂණ සහ දක්වා ඇති නිගමනයන් පදනම් කරගෙන පහත සඳහන් ප්‍රදානය පිරිනමමි.

කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) පනත් වලින් සංශෝධනය වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2016.01.28 දිනැති නියෝගයෙන් මා වෙත යොමුකර ඇති යොමුව සම්බන්ධයෙන් වන කාර්මික ආරවුලට අදාළ පී. පී. සේනානායක මහත්මියගේ ඉල්ලීම නිශ්ප්‍රභා කරමි.

**එස්. වීරතමුල්ල,**
බේරුම්කරු.

2017 සැප්තැම්බර් මස 20 වැනි දින කාර්මික අධිකරණයේදී ය.

02 - 74

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.